# අනිත් කොණ

සායනික සටහන් නොවේ



වෛද්‍ය
බෝධිනී සමරතුංග

**වෛද්‍ය බෝධිනී සමරතුංග ගේ ලිපි සන්නස පාඨකයනට ආගන්තුක නොවේ. කිවිඳියක බ්ලොග් රචිකාවියක වන බෝධිනී මේ වසරේ නෙළුම්යාය බ්ලොග් සම්මාන උළෙලේදී සම්මානයට ද පාත්‍ර වූවා ය. ශ්‍රී ලංකාවේ පුවත්පත් කීපයකම ඇගේ කොලම් පළවෙයි. නැවත වතාවක් සන්නස පාඨකයන් සමග ඇගේ අත්දැකීම් බෙදාගන්නට වෛද්‍ය බෝධිනී සමරතුංග මෙසේ අප හා එක්වෙයි.**

## හුස්ම ඉල්ලද්දී නොදී කොහොමද ?

හරියට වැඩෙන්නත් කලින්, ඔයා හිත හදන් එන්නත් කලින් ඔයාට එන්න වැඩ සිද්ධවෙන-කොට, හුස්ම ඉල්ලගෙන ආපු ඔයාට හුස්ම නොදී කොහොමද පුතේ...

අම්මාටත් එපා වුණු ඔයාට හොර ගබ්සා මධ්‍යස්ථානයේදිම පරලොව යන්න සිද්ධ නොකර හදිසියේම අපි ඉන්න හවසක රෝහලටම ඒගන්න ඒ අම්මාට සිදුවුනේ දෛ-වයේ හාස්කම නිසා. ඒක වාසනාවද අවාසනාවද කියලා මම දන්නේම නෑ පුතේ...

ඒ අම්මව ඒ තරම් අසරණ කරපු මිනිහෙක් කොහේ හරි ඇති. සමහර විට මේ පුතා බරක් වෙන්න තරම් ඒ දෙන්නම අසරණ ඇති. සති විසි ගාණක් වෙද්දි මෙහෙම කරන්න හිත හදාගත්තෙ කොහොමද කියලා අපි ඇහුවේ නෑ. අපේ කලබලය අස්සේ මම දැක්කා ඔයාගේ අම්මා අඬනවා. ඔයා නියමිත කාලයක් හිටියනම් හොඳ වැඩුණු බබෙක් ලෙස එළියට එන්න තිබ්බා. ඇම්බෝ, ලැරින්ජොස්කෝප්, ටියුබ් ඔක්සිජන් මේ සියල්ල ළඟට අරන් අපි ඔයාව ජීවත් කෙරෙව්වා. ඔයාව ශ්වසන මැශිමක් තියෙන

> **තමන්ට බරක් වෙන දරුවෙක් වෙනුවෙන් හරි උදව්වක් ඒ අම්මලාට ලැබෙන ක්‍රමවේදයක් මේ සමාජෙට අවශ්‍යයි කියා මම තරයේ විශ්වාස කරනවා. එතකොට ඒ අම්මලාට දරුවෝ බරක් වෙන එකක් නෑ.**

ඔයාව ජීවත් කරවපු එක අපි කළ වැරැද්ද-ක්ද දන්නේ නෑ පුතේ. අපිට උගන්වලා තියෙන්නේ ජීවිත ජීවත් කරවන්නයි (

අම්මාට අමාරුවෙනකොට හොර ගබ්සා මධ්‍යස්ථානයෙන් රජයේ රෝහල් වලට පටවන එකයි කරන්නේ. අම්මාගෙත් ජීවිතේ අනතුරේ.

අම්මෙක්ට ඒ තත්වෙට පත්වෙන්න හිත හදාගන්න පුළුවන් තරමට සමාජය පිරිහිලා.

රෝහලක් හොයාගෙන ඒකට ගිහින් සම්බන්ද කරනකම් ඔයා හුස්ම ගත්තා තනියම. ඔයා හරි ශක්තිමත් කියලමයි අපිට හිතුනේ පුතේ....

ඒ වෙලාවේ ඉඳන් මම හරිම හිතේ මහන්සියෙන් හිටියේ , සංවේදී මිනිස්සු නිසා ලොකු දුකක් දැනෙනවා.

දරුවෝ නැති මගේ යහළුවෝ අනන්ත දුක් වෙනවා. එයාලට දරුවෙක් නැති දුක තේරෙනවා.

සමහර විට ඔයාගේ අම්මත් දුක් වෙනවා ඇති. ඔයාව අපිට ජීවත් කරන්න වුනා. සමහර විට එයාට වෙන කරන්නම දෙයක් නොතිබෙන්න ඇති. සමහර විට... මම දන්නේ නෑ. මම මොකුත් ඇහුවේ නෑ.

සමහර විට ඔයාව ළමා නිවාසෙකට බාර දෙයි. සමාජෙට වෛර නොකරන කෙනෙක් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.



ගැහැණු සහ දරුවන් අසරණ නොවන සමාජයක් බිහි කරන්න ඔයාටවත් පුළුවන් වේවි කියා මම ප්‍රාර්ථනා කරනවා ( දරුවන්ට , තරුණ තරුණියන්ට හරි ලිංගික අධ්‍යාපනයක් දෙන රටක් සමාජයක් බිහිවේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. තමන්ට බරක් වෙන දරුවෙක් වෙනුවෙන් හරි උදව්වක් ඒ අම්මලාට ලැබෙන ක්‍රමවේදයක් මේ සමාජෙට අවශ්‍යයි කියා මම තරයේ විශ්වාස කරනවා. එතකොට ඒ අම්මලාට දරුවෝ බරක් වෙන එකක් නෑ.

උපදේශනය, දරුවා වැඩෙන තෙක් බිහිවන තෙක් රැකවරණය මේ අවිවාහක අම්මලාට ලැබේනම් මේ ලෙස අතර මැද දරුවන් අසරණ නොවෙන්නත් ඉඩ තිබුනා. සමාජ හීතිකා බවට පත් කර, අවජාතකයා යැයි ලේබල් ගසන්නේ නැතිනම් මේ තනිකඩ අම්මලා දරුවන් හදාගන්නත් ඉඩ තිබ්බා.

බොහෝ වෙහෙස හිතත්, මේ දරුණු ඛේදවාචක දකින නෙතත් නිතර දුක් වෙනවා. මේවා හිරකරගෙන ඉන්න බැරි නිසා සටහන් කර තබන්න සිතුවා.




